**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2020**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර,අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි සඳහන් නියමයන්ට අනුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වත්කම් පන්තියට අදාල සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු නොකර ඉකුත් වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් භාවිතා කරමින් පැවති පිරිවැය රු.83,230,824 ක් වූ වර්ෂ 04 කට අයත් වත්කම් අයිතම 422 ක් ප්‍රත්‍යාගණනය කර තිබුණි. එයින් ඇති වී තිබුණු ප්‍රත්‍යාගණන සංචිතය ද සමුච්චිත ලාභයට ගලපා එම වත්කම් වාර්ෂිකව ක්ෂය කිරීමේ ක්ෂය වියදම වූ රු.30,943,048 ක් රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමට ගලපා තිබුණි. එම නිසා | මූල්‍ය ප්‍රකාශන තුළින් මුළු වියදම් ප්‍රමාණය (ක්ෂය ප්‍රමාණය) ඉදිරිපත් කිරීම අරමුණු කරගෙන ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල ක්ෂය ප්‍රමාණයද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි සටහන් කරන ලද අතර, ඒ අනුව විලම්භිත ආදායමට එම ප්‍රමාණය ගැලපුම් කිරීම අධිකාරිය ප්‍රතිපත්තියක් වශයෙන් කරන ලදී. මෙය ගිණුම්කරණ සටහනකින් විස්තරාත්මක ලෙස ඉදිරිපත් කර තිබූ අතර, මේ සඳහා විගණනයේ විරුද්ධතාවයක් නොදැක්වීම හේතුවෙන් එම ක්‍රමය අඛණ්ඩව කරගෙන යන ලදී. කෙසේ වුවත්, රජයේ විගණනය විසින් මෙවර ඉදිරිපත් කර ඇති ක්‍රමවේදයට | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි සඳහන් නියමයන්ට අනුව ප්‍රත්‍යාගණනයක් සිදුකල යුතු අතර, අදාල ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කල යුතුය. |

සමාලෝචිත වර්ෂය අවසානයට අනුව 2021 වර්ෂයේ සිට ක්‍රියා කරනු ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය ලබන අතර, පසුගිය වර්ෂයට වන රු.4,338,513 ක අසාමාන්‍ය සෘණ ගැලපීම 2021 අවසන් ගිණුම සමඟ අගයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කරමි. දැක්වුණි.

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අධිකාරිය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු අතර 2020 සිට 2022 තුන් අවුරුදු කාල සීමාව සඳහා සංයුක්ත සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණු නමුත් විගණනය පෙන්වා දුන් පරිදි 2021 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත. | චක්‍රලේඛයට අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,927,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 74,270,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 78,197,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් රු.25,679,000 කින් හා දඩ මුදල් ආදායම රු. 17,268,000 කින් අඩු වී තිබීම හා පුද්ගලික පඩිනඩි රු. 20,570,000කින් හා බේරුම්කරණ වියදම් රු. 22,163,000කින් වැඩි වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරී පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විට වසර 16 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි. | 2021 මැයි මාසය වන විට අවසාන කෙටුම්පත සමාලෝචනයට අදාලව කමිටුව විසින් රැස්වීම් පවත්වා අවසන්ව ඇත. එසේම රාජ්‍ය අමාත්‍යතුමා සමඟද රැස්වීම් වාරයක් පවත්වා ඇත. නව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත සකස් කර අමාත්‍යාංශ ලේකම් වෙත භාර දී ඇත. | පනත සංශෝධන කටයුතු නියමිත කාලසීමාව තුල නිම කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජූලි 29 දිනැති අංක 2186/17 දරන ගැසට් පත්‍රය මගින් රසායනාගාර පරීක්ෂණ සඳහා මිල පාලනය කර තිබුණ ද එම මිල පාලනය පාරිභෝගිකයා අතරට ගිය බවට සමීක්ෂණ කිරීමට කිසිදු වැටලීමක් පාරිභෝගික අධිකාරිය විසින් සිදුකර නොතිබුණි. | බොහෝ රසායනාගාර පාලන මිලට ගාස්තු අය කර ඇති අතර වැඩිපුර අය කළ එක් රසායනාගාරයක් සම්බන්ධව වැටලීම් සිදු කර ඇත. (නඩු ලේඛන අංක 2021/84 හි සටහන් කර ඇත) ඒ සම්බන්ධව ඉදිරියේදී නඩු පැවරීමට කටයුතු කිරීමට නියමිතය. ඉදිරියේදී රසායනාගාර පරීක්ෂණ වාර්තාවල මිල සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික්ක දැනුවත් කිරීමට කටයුතු කරමි. | රසායනාගාර පරීක්ෂණ වාර්තාවල මිල සම්බන්ධයෙන් වැටලීම් සිදුකළ යුතුය. |
| (ආ) | 2020 වර්ෂයේදී මහේස්ත්‍රාත් අධිකරණ මගින් එවන ලද දඩමුදල්වලින් රු.7,676,874 ක් වටිනා චෙක්පත් 154 ක් කල් ඉකුත් වී තිබීම හේතුවෙන් නැවත අධිකරණය වෙත යවා තිබුණි. එම චෙක්පත් මහේස්ත්‍රාත් අධිකරණ මගින් නිකුත් කල දිනය හා එම චෙක්පත් නැවත අධිකරණ වෙත යවන ලද දිනය අතර දින 45 ක පමණ කාලයක් පැවතීම යනු චෙක්පත් නිශ්කාෂණය කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් වුවද අධිකාරිය ඒ සඳහා ක්‍රියාකර නොතිබුණි. | පසුගිය වර්ෂයේ (2020) රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් තැපැල් කාර්යාල වසා දැමීම හා එම ප්‍රදේශ හුදකලා කර තිබීම සහ කාර්යාල වෙත සේවකයින් ගෙන්වා ගැනීම සීමා කිරීම ආදී හේතූන් නිසා මෙවැනි ප්‍රමාණයක චෙක්පත් කාලය ඉකුත් වී දින දීර්ඝ කර ගැනීම සඳහා නැවත අධිකරණ වෙත යැවීමට සිදුවිය. | චෙක්පත් අගරුවීම අවම කර ගැනීමට ක්‍රියා මාර්ග ගත යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,556 කින් පැමිණිලි 678 කට 2020 දෙසැම්බර් 31 දින වනවිට විසඳුම් ලබා දී තිබුණු අතර පැමිණිලි 166 ක් ඉවත්කර තිබුණි. පැමිණිලි 256 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර පැමිණිලි 456 ක් සඳහා කැඳවීම් කිරීමට නියමිතව තිබුණි. මෙලෙස කැඳවීම් කිරීමට නියමිත පැමිණිලි 456 න් පැමිණිලි 175 ක් 2018 වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා යොමු කල පැමිණිලි විය. සමාලෝචිත වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා | 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුල නීති අංශය ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,556 න් 524 කට 2020.12.31 දින වන විට විසඳුම් ලබා දී තිබුණු අතර පැමිණිලි 166 ක් ඉවත් කර තිබුණි. පැමිණිලි 410 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර පැමිණිලි 456 ක් සඳහා කැඳවීම් කිරීමට නියමිතව තිබුණි. මෙලෙස කැඳවීම් කිරීමට නියමිත පැමිණිලි 456 න් පැමිණිලි 175 ක් 2018 වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා යොමු කල පැමිණිලි විය. | පාරිභෝගික පැමිණිලි විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | යොමුකල පැමිණිලි 80 කින් පැමිණිලි 04 ක් පමණක් විසඳා තිබුණු අතර පැමිණිලි 74 ක් සඳහා  කැඳවීම් සිදුකර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී විමර්ශන කටයුතු සඳහා යොමුකල පැමිණිලි 80 කින් පැමිණිලි  04 ක් පමණක් විසඳා තිබුණු අතර පැමිණිලි 74 ක් සඳහා  කැඳවීම් සිදුකර නොතිබුණි. | |
| (ඇ) | පාරිභෝගිකයින්ට ක්ෂණික වෙළෙඳපොලේ මිලගණන් දැනගැනීමට සහ ක්ෂණික පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා 1977 දුරකථන සේවාව 2013 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර, ඒ සඳහාරු.9,188,396 ක වියදමක් දරා තිබුණි. ක්ෂණික ඇමතුම් සහන සේවාවට 2020 වර්ෂයේ මාර්තු මස සිට දෙසැම්බර් මාසය දක්වා මහජන පැමිණිලි 5,104 ක් ලැබී තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පැමිණිලි 3790 ක් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මාස 10 ක කාලයක් සඳහා ලද පැමිණිලි වලින් සියයට 74 ක් සඳහා අදාල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි, පෙබරවාරි මාස දෙකට අදාලව දත්ත ගබඩාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2020 වර්ෂයේදී රට තුල පැවති වසංගත තත්ත්වය තුල මෙම රාජකාරී සිදුකර ඇති අතර 1977 පැමිණිලි සම්බන්ධයෙන් ගනු ලබන පියවර පිළිබඳව සෑම දිස්ත්‍රික්කයකින්ම මාසිකව වාර්තාවක් ලබාගැනීමටත් ඒ අනුව මෙම ක්‍රියාවලිය දැඩි ලෙස අධීක්ෂණය කරමින් මාසිකව ලැබී ඇති පැමිණිලිවලින් අවම වශයෙන් 80%ක ප්‍රමාණයක් සඳහා ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරමි. ඒ සඳහා ලිඛිත උපදෙස් මාලාවක් සියළුම දිස්ත්‍රික් කාර්යාල වෙත නිකුත් කිරීමටද කටයුතු කරමි.  2021 වර්ෂයේදී මෙම විගණන වාර්තාව මගින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කරගනිමින් පාරිභෝගික ජනතාවට වඩා හොඳ සේවාවක් ලබාදීමට කටයුතු කරමි. | පාරිභෝගික පැමිණිලි විසඳීමේ කටයුතු කඩිනමින් අවසන් කල යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල අධිකාරිය විසින් වැටලීම් 15,923 ක් සිදු කර ඇති අතර, එය පෙර වර්ෂයේ සිදු කල 24,061 ක් වූ වැටලීම් වලට සාපේක්ෂව සියයට 34 ක පහල වැටීමක් වේ. තවද 2019 වර්ෂයේ දඩ ලෙස රු.39,094,340 ක ආදායමක් උපයා ඇති අතර සමාලෝචිත වර්ෂයේ එය රු.21,826,267 ක් දක්වා එනම් සියයට 44 ක පහත වැටීමකි. | 2020 වර්ෂය සඳහා වැටලීම් 26,004 ක සංඛ්‍යාවක් වර්ෂය ආරම්භයේදී සැලසුම් කරන ලද නමුත් කොවිඩ් වසංගත තත්ත්වය මාර්තු මස සිට පැතිරීම හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරී නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම නිසා සත්‍ය වැටලීම් සංඛ්‍යාව 15,923කට සීමා වී ඇත.<br>එසේම වැටලීම් සඳහා දඩ මුදල් තීරණය කිරීම පාරිභෝගික අධිකාරියෙන් පරිබාහිරව සිදුවන කටයුත්තක් වීමත්, කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඇතැම් ප්‍රදේශ වසා දැමීම හා අධිකරණවල කටයුතු සීමා කිරීම වැනි හේතු නිසා අධිකරණයේ නඩු පැවරීම් 2020 වර්ෂයේ අඩුවීමද නිසා දඩ මුදල් අගය පහත වැටීමට හේතු වී තිබුණි. | වැටලීම් ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | නිවැරදි ප්‍රමිතියෙන් යුතු භාණ්ඩ පාරිභෝගිකයින්ට හඳුනා ගැනීමේ පහසුව සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමේ අරමුණින් 2014 ජනවාරි 24 දින SICPA Security Solutions Switzerland ආයතනය සමඟ ගිවිසුම් ගත වී ඇති අතර, අදාල ආයතනය සමඟ ගිවිසුම පරිදි ක්‍රියාත්මක නොවීම මත 2018 වර්ෂයේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය මේ සම්බන්ධයෙන් බේරුම්කරණයට ඉදිරිපත් වී තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක CAA/L&E/20/2020 ප්‍රකාරව මෙම නඩු කටයුත්ත සම්බන්ධව අධිකාරියේ අරමුදලින් රු.මිලියන 55 ක් දක්වා වියදම් පියවීම සඳහා අනුමැතිය ලැබී තිබුණි. 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 49 (3) වගන්තියේ සඳහන් අරමුදලින් ගෙවිය හැකි වැය කිරීම් පිළිබඳ නියමයන් දක්වා තිබුණ ද එම නියමයන් ඉක්මවා යමින් සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 55 ක වියදම් ප්‍රතිපූරණය සඳහා අනුමැතිය ලබා දී තිබුණු අතර ඒ අනුමැතිය මත ඉහත බේරුම්කරණය සම්බන්ධව රු.22,162,690 ක වියදමක් අරමුදල විසින් 2020 ජූලි සිට දෙසැම්බර් දක්වා දරා තිබුණි. | SICPA Security Solutions SA ආයතනය සහ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය අතර 2014.01.24 වන දින ඇතිකරගත් ගිවිසුම නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවීම මත SICPA SAආයතනය විසින් බේරුම්කරණ නඩු කටයුත්ත ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ජාත්‍යන්තර බේරුම්කරණ අධිකරණය (International Court of Arbitration of the International of Commerce) ඉදිරියේ පවරා ඇත.<br>මෙම බේරුම්කරණ නඩු කටයුත්ත අදියර 2කින් පැවති අතර එහි දෙවන අදියර සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීය සේවා ගාස්තුව රු.3,950,000/- බව නීතිපති දෙපාර්තමේන්තුව විසින් පූර්වයෙන් දන්වා තිබූ බැවින් බේරුම්කරණ නඩු කටයුත්ත සඳහා රු.22,162,690 ක මුදලක් වැයකිරීමට නියමිතව තිබුණි.<br>නමුත් 2021.03.22 වන දිනැති නීතිපති දෙපාර්තමේන්තුව විසින් අධිකාරිය වෙත යොමුකරන ලද ඉන්වොයිස් පත්‍රය අනුව දෙවන අදියර වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීය සේවා ගාස්තුව රු.1,247,000ක් බව දැනුම් දී ඇත.<br>ඒ අනුව ඉහත කී බේරුම්කරණ නඩු කටයුත්ත වෙනුවෙන් මේවනවිට රු.19,763,982 ක මුදලක් අධිකාරිය විසින් වැයකර ඇත. | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 60 (6) වගන්තිය අනුව පෙර වැරදි කීපවරක් ඇතිවීමට වැරදිකරු කරනු ලබන ඇත්තන්ගේ නම් හා ලිපිනයන් අධිකාරිය සුදුසුයයි සලකන යම් ආකාරයකින් ප්‍රකාශයට පත් කර පාරිභෝගිකයා දැනුවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවෙන්ද පෙන්වා දුන් පරිදි 2021 වර්ෂයේ සිට අධිකාරියේ වෙබ් අඩවිය තුළ මෙම තොරතුරු පළ කිරීමට කටයුතු කරමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 61(3) වගන්තිය අනුව 2020 වර්ෂයේ පරීක්ෂා කරන ලද සාම්පල් 299 ක් අතුරින් සාම්පල් 112 ක් නියමිත ප්‍රමිතියෙන් හා පිරිවිතරයන්ගෙන් තොර බව තහවුරු කර තිබියදීත් නියමිත ප්‍රමිතයෙන් හා පිරිවිතරයන්ගෙන් තොර භාණ්ඩ තහනමට ගෙන රඳවා තබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ පරීක්ෂා කරන ලද සාම්පල් ප්‍රමාණය 299 ක් වූ අතර එයින් සාම්පල් 165 ක් සම්බන්ධයෙන් අහිතකර ප්‍රථිඵල ලැබී ඇත.<br>අයහපත් ප්‍රතිඵල සහිත සාම්පල් සියල්ල ප්‍රමිති පිරිවිතරයන්ගෙන් තොර බව සඳහන් කළ නොහැක. ඊට හේතුව වන්නේ සමහර සාම්පල විවිධ පැමිණිලි මත ලබාගෙන පරීක්ෂා කරනු ලබයි. එහිදී ප්‍රමිතිය පරීක්ෂාව සිදු නොවන අවස්ථාද තිබිය හැකිය. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 667 ක් වන අතර තත්‍ය සේවක සංඛ්‍යාව 531 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 136 ක් පැවතුණි. 2020 වර්ෂයේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වරින්වර පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා රු.831,222 ක් වැයකර තිබුණද විගණිත දිනය වන 2021 පෙබරවාරි 22 වන විට පුරප්පාඩු තනතුරු 3 ක් පමණක් පිරවීමට කටයුතු කර තිබුණි. එසේම විනය ක්‍රියාමාර්ග මත වැටුප් විලම්භනය කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් නොවීම වැනි අඩුපාඩු පැවතියදීත් 2019 ඔක්තෝම්බර් 01 දින ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් 04 දෙනෙකු සඳහා පත්වීම් ලබා දී තිබුණු අතර අතිරේක/වෘත්තිය සුදුසුකම් සඳහා ලබාදුන් ලකුණු ප්‍රමාණයන් සම්බන්ධයෙන්ද නිර්ණායකයන් සකස් කර නොතිබුණි. | පුරප්පාඩු 136 න් පුරප්පාඩු 82 ක් විමර්ශන නිලධාරීන්ය. නමුත් 2018 වර්ෂයේදී කාර්යය මණ්ඩල අවශ්‍යතාවය සාධාරණීකරණය නොකර අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව විමර්ශන නිලධාරීන් 207 ක් බඳවා ගෙන ඇත. විමර්ශන නිලධාරීන් අවශ්‍ය ප්‍රමාණයට සිටින බැවින් විමර්ශන නිලධාරීන් බඳවා ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත. බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකර ඇත්තේ තනතුරු 10 ක ප්‍රමාණයකටය. ඉන් තනතුරු 04 කට බඳවා ගෙන ඇත. මෙම නිලධාරීන් 04 දෙනා හට උසස් වීම් ලබා දී ඇති ආකාරය පිළිබඳ මූලික විමර්ශනයක් පැවැත්වීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. | ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරීන් පත්කිරීම සම්බන්ධව විමර්ශන කටයුතු කඩනමින් නිම කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුයි. |